## කොළඹ විශ්වවිද්‍යාලය - අධ්‍යාපන පීඨය
## අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය

# මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව-2017/18

ඉහත සඳහන් පාඨමාලාවට ඇතුළත් කරගැනීම සඳහා මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය නියමිත සුදුසුකම් ඇති පාසල්, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල උපදේශන හෝ උපදේශන සේවා පරිපාලන කටයුතු හෝ ඉගැන්වීමේ නිරත අයගෙන් ද, රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හෝ ආයතනවල උපදේශන සේවා ක්ෂේත්‍රයේ නියැලි/පෞද්ගලික අංශයේ උපදේශනය අදාළ වන වෘත්තීන්හි නියැලි හෝ විශ්‍රාමික හෝ උපදේශනයේ නියැලීමට අපේක්ෂා කරන පුද්ගලයින්ගෙන් ද අයදුම්පත් භාරගනු ලැබේ.

***පාඨමාලාවේ අරමුණු*** : උපදේශන සේවා ක්ෂේත්‍රයට සුදුසු විද්වත් උපදේශන වෘත්තිකයින් බිහි කිරීම හා එමගින් ශ්‍රී ලංකාවේ පාසල්, රාජ්‍ය/පෞද්ගලික ආයතනවල උපදේශන සේවාවේ දායකත්වය පුළුල් කිරීම.

***ඇතුළත්වීමේ සුදුසුකම්:***
1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
2. උපදේශනය අවශ්‍යවන සේවා/වෘත්තියක යෙදී සිටීම.
3. පාඨමාලාවෙන් පසු උපදේශන සේවයේ යෙදීමට කැමැතිවීම

***පාඨමාලා ගාස්තු:*** රු. 100,000/- ***කාලය:*** මාස 15 ***මාධ්‍යය:*** සිංහල
*(මෙම පාඨමාලාව සුදුසුකමක් සේ පිළිගන්නා රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මෙන්ම අර්ධ රාජ්‍ය හා ඇතැම් පෞද්ගලික ආයතන ද පාඨමාලා ගාස්තුව සේවා යෝජකයන් විසින් දරනු ලබයි. )*

***දේශන හා පුහුණුව:*** සෙනසුරාදා හා ඉරිදා දිනවලදී
***අයදුම්පත් භාරගන්නා අවසාන දිනය:*** 2017 ජූලි 28

*අයදුම්පත් හා පාඨමාලාවේ විස්තර:* තම පෞද්ගලික ලිපිනය ලියූ රු.15/-ක මුද්දර අලවන ලද සෙ.මී. 22x10 ප්‍රමාණයේ ලියුම් කවරයක් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ** 3, යන ලිපිනයට එවීමෙන් හෝ පැමිණ හෝ www.edu.cmb.ac.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, කොළඹ විශ්වවිද්‍යාලයේ අංක **306040400003** දරන ගිනුමට රු. 750/-ක් බැර කරන ලද රිස්ට් පතේ පිටපතක් සමග ඉහත ලිපිනයට එවිය යුතුය.

විමසීම්- 011-2504734/011-2596888

**ලේඛකාධිකාරී**
**කොළඹ විශ්වවිද්‍යාලය**